දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 02/2011

මගේ අංකය - AD/5/දෙපා.ච./2011
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2011.04.07

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්.
සියළුම අධ්‍යක්ෂවරුන්.

<u>සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය.</u>

2011.04.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. අධ්‍යක්ෂ ජනරාල්
   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2. සත්ව සෞඛ්‍ය අංශය
3. සත්ව අභිජනන අංශය
4. පශු පර්යේෂණ අංශය
5. මානව සම්පත් සංවර්ධන අංශය
6. පශු සැලසුම් හා ආර්ථික අංශය
7. නීති අංශය
8. පරිපාලන අංශය
9. මූල්‍ය අංශය
10. අභ්‍යන්තර විගණන අංශය

02. මේ අනුව අභිනවයෙන් ස්ථාපිත වූ නීති අංශයට දෙපර්තමේන්තුවේ ක්‍රියාත්මක වූ පහත සඳහන් අංශ/විෂයයන් ඇතුලත් වනු ඇත.

1. ලේඛකාධිකාරී - සත්ව ආහාර
2. ලේඛකාධිකාරී - පශු ඖෂධ
3 නීති අතපනත් ක්‍රියාත්මක කිරීම
4. සත්ව නිරෝධායනය

මෙම අංශයට සියළු විෂයයන් පිලිබඳව වගකීම පැවරෙන අධ්‍යක්ෂ වරයෙකු පත් කිරීමට කටයුතු කරනු ඇත.

03. මේ අනුව. සියළුම අධ්‍යක්ෂ වරුන් විසින් තම අංශයන් සංවිධානය කර ගතයුතු අතර. දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය ඒ ඒ අංශවලට දැනට බෙදා හැරී ඇති ආකාරය අනුවම කාර්ය මණ්ඩල අනුයුක්ත වනු ඇත.

04. ඉහත 02 ජේදයෙහි සඳහන් විෂයයන් ක්‍රියත්මක කල මාණ්ඩලික නිලධාරීන් තම 'රාජකාරී විස්තර' ලේඛණය මේ අනුව සංශෝධනය කර සංශෝධිත රාජකාරී විස්තරය පෞද්ගලික ලිපි ගොනුවට ඉදිරිපත් කල යුතු බව කාරුණිකව දන්වමි.

05. අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ පරිපාලන කටයුතු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන බවද වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

06. නව සංවිධාන ව්‍යුහයට අනුකූලව අංශ සටහන් කිරීමේ අනුපිළිවෙල හා ලිපිගොනු සඳහා අංශය හඳුන්වා දීමේ කෙටි නාමය පහත සඳහන් පරිදි විය යුතුවේ.

| | අංශය | කෙටි හැඳින්වීම |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | DG |
| 2. | සත්ව සෞඛ්‍ය අංශය | AH |
| 3. | සත්ව අභිජනන අංශය | AB |
| 4. | පශු පර්යේෂණ අංශය | VR |
| 5. | මානව සම්පත් සංවර්ධන අංශය | HRD |
| 6. | පශු සැලසුම් හා ආර්ථික අංශය | LPE |
| 7. | නීති අංශය | LR |
| 8. | පරිපාලන අංශය | AD |
| 9. | මූල්‍ය අංශය | FD |

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2/2010 හි 03 ජේදය මේ අනුව 2011.04.04 දින සිට සංශෝධනය වන බව සටහන් කරගනු මැනවි.

වෛද්‍ය එස්.කේ. ද සිල්වා.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ.)